# පැතලි කොන්ක්‍රීට් වහල....

*5 වැනි පිටුවෙන්*

පළමු බලපත්‍රය ලබාගත්තේ මෙහි බර සංවරණය කිරීමේ සැකැස්මට. එහි දී අප ජලය ගලා යෑමට හැකි වන ලෙස සහ ඕනෑ ම ප්‍රායෝගික බරක් දරාගත හැකි ආකාරයට එම සැකසුම නිර්මාණය කිරීමට. දෙවැන්න උණ බට සහ වායු අවකාශයක් මුසු කර නිර්මාණය කළ පාරිවාරක ද්‍රව්‍යයට. එමගින් ඉතා ම අඩු වියදමකින් හොඳ තාප පරිවරණයක් ලබාගැනීමට අපට හැකි වුණා.

**පර්යේෂණවල නිරත වෙද්දී ඔබ මුහුණ දුන් අභියෝග හා ඒවා ජයගත්තේ කෙසේ ද?**

දහසකුත් එකක් අභියෝගවලට මුහුණ දෙන්න සිදු වුණා. ඒවා එකින් එක විස්තර කිරීම අනවශ්‍යයි කියල හිතනවා. ඒ හැම අභියෝගයක් ම පන්නරයක් කරගෙන ඉදිරියට ගියා. මහාචාර්ය හල්වතුර මහතා, මව, පියා, සහෝදරයා, බිරිඳ ඇතුළු පවුලේ සාමාජිකයන් සහ අපගේ පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකයන්ගේ සහයෝගය නොමැති වූවා නම් මෙහි අවසාන ඵලයක් නො දකින්න බොහෝ සේ ඉඩ තිබුණා. එම නිසා අනිවාර්යයෙන් ම ඒ සියලු දෙනා ම ඉතා ම ආදරයෙන් සිහිපත් කළ යුතුයි.

**මේ පර්යේෂණයෙන් නිර්මාණය කළ පරිවාරක පද්ධතිය වෙළෙඳපොළට හඳුන්වා දීමට ඔබ බලාපොරොත්තු වනවා ද? එහි නිෂ්පාදන පිරිවැය සම්බන්ධයෙන් ඔබට දළ අදහසක් තිබෙනවා ද?**

අනිවාර්යයෙන් ම. මම කලින් කිව්වා වගේ මෙහි පිරිවැය දළ වශයෙන් වහලයට යන වියදමින් 5%ක් පමණ. ඒ සඳහා අවශ්‍ය උපදේශන කටයුතු කිරීමට අනිවාර්යයෙන් ම සූදානමින් සිටිනවා.

සර්ම කලාපීය රටක් වශයෙන් ගොඩනැඟිලි ඇතුළත ඇති වන අධික උණුසුම අවම කරගැනීම ශ්‍රී ලංකාව හමුවේ ද පවතින අභියෝගයක්. එම අභියෝගයට විසඳුමක් ලෙස දේශීය අමුද්‍රව්‍ය යොදාගනිමින් අඩු වියදමකින් නිෂ්පාදනය කළ හැකි කල් පවත්නා පැතලි කොන්ක්‍රීට් වහලයට යෙදිය හැකි තාප පරිවාරක පද්ධතියක් මේ පර්යේෂකයන් විසින් නිර්මාණය කිරීම ඉතා ම ප්‍රසංශා කටයුතුයි. අනාගතයේ දී ඔබ ඉදි කිරීමට බලාපොරොත්තු වන නිවසකට හෝ  ගොඩනැඟිල්ලකට ද මේ තාප පරිවාරක පද්ධතිය යොදාගැනීමෙන් ඇතුළත සුදුසු උෂ්ණත්වයක පවත්වාගෙන යෑමට අමතර පිරිවැයක් දැරීමට සිදු වීම වළක්වාගත හැකි වනු ඇති. මෙවන් කාලීන සහ අප රටට වැදගත් වන ප්‍රශ්න උදෙසා ශ්‍රී ලාංකීය විද්‍යාඥයන් විසින්ම සාර්ථක විසඳුම් ඉදිරිපත් කිරීම ආඩම්බරයට කරුණක්.